Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

# විද්‍යාව

8 ශ්‍රේණිය | කාලය පැය 02 යි

| නම/ විභාග අංකයඃ |
|---|

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න. වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පෘෂ්ඨවංශීන් පමණක් අඩංගු වන පිළිතුර තෝරන්න.
(1) මිනිසා, වවුලා, ගොළුබෙල්ලා. (2) කටුස්සා, නයා, සමනලයා.
(3) කකුළුවා, ඩොල්ෆින්, වවුලා. (4) කටුස්සා, ගෙම්බා, සලමන්දරා


02. ශාක පත්‍රය කාර්යක්ෂමව ප්‍රභාසංස්ලේෂණය සිදු කිරීමට හැඩගැසී ඇති ආකාරයකි,
(1) පත්‍රය පත්‍රිකාවලට බෙදී තිබීම. (2) පත්‍ර පළල් වීම හා තුනී වීම.
(3) පත්‍ර මාංශල වීම. (4) පත්‍රයේ ආහාර සංචිත කර තිබීම.

03. කොපර් සල්ෆේට් වල අඩංගු මූල ද්‍රව්‍ය මොනවාද?
(1) කොපර්, සල්ෆර්, ඔක්සිජන් (2) සල්ෆර්, ඔක්සිජන්, යකඩ
(3) කොපර්, යකඩ, සල්ෆර් (4) සල්ෆර්, යකඩ, ඔක්සිජන්

04. නිවැරදි වගන්තිය තෝරන්න.
(1) වයලිනය පටල කම්පනය වන සංගීත භාණ්ඩයකි.
(2) සියළුම සංගීත භාණ්ඩ ධ්වනි ප්‍රභව වේ.
(3) රබාන රත්කිරීමෙන් එහි තාරතාව අඩු වේ.
(4) ශබ්දයේ වේගය ආලෝකයේ වේගයට වඩා වැඩිය.

05. වැඩිම හංගුරතාව සහිත ද්‍රව්‍ය තෝරන්න.
(1) තඹ (2) යකඩ (3) ගෙන්දගම් (4) මැග්නීසියම්

06. චුම්භකයක අවම චුම්භක බලය බලපවත්වන ප්‍රදේශය හඳුන්වන්නේ,
(1) චුම්භකයේ ධ්‍රැව ලෙසය. (2) චුම්භකයේ බලරේඛා ලෙසය.
(3) චුම්භකයේ ක්ෂේත්‍රය ලෙසය. (4) චුම්භකයේ චුම්භක ගුණය ලෙසය.

07. 

ඉහත පරිපථයේ බල්බ හා කෝෂ සම්බන්ධ කර ඇති නිවැරදි පිළිතුර වනුයේ,
(1) බල්බ සමාන්තර ගතව, කෝෂ ශ්‍රේණිගතව
(2) බල්බ හා කෝෂ සමාන්තරගතව
(3) කෝෂ සමාන්තරගතව බල්බ ශ්‍රේණිගතව
(4) කෝෂ හා බල්බ ශ්‍රේණිගතව

08. ප්‍රතිරෝධය මනින ඒකකය කුමක්ද?
(1) ඇම්පියර් (2) වෝල්ට් (3) වොට් (4) ඕම්

09. මැග්නීසියම් පටියක් දහනය කිරීමේදී දක්නට ලැබෙන නිරීක්ෂණ මොනවාද ?
(1) සිදු පැහැති ආලෝකය හා නිල් පැහැති කුඩක් (2) සුදු දීප්තිමත් ආලෝකය හා සුදු පැහැති කුඩක්
(3) කහ දීප්තිමත් දැල්ලක් හා සුදුපාට කුඩක්. (4) සුදු දීප්තිමත් ආලෝකයක් හා කහපාට කුඩක්.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com


10. භෞතික විපර්යාසයක් හා රසායනික විපර්යාසයක් පිළිවෙලින් ඇති පිළිතුර තෝරන්න.

(1) අයිස් දියවීම, ලුණු කැට ජලයේ දියවීම.

(2) දර කැබැල්ලක් දහනය වීම, ශීත දිනවලදී පොල්තෙල් මිදීම.

(3) ලෙඩ් නයිට්‍රේට් රත් කිරීම, කඩදාසියක් දැවීම.

(4) ඉටි ද්‍රව වීම, මැග්නීසියම් පටියක් දහනය වීම.

11. 


මෙහි දක්වා ඇත්තේ ගිනි ත්‍රිකෝණයේ රූප සටහනකි. එහි A හා B විය හැක්කේ පිළිවෙලින්,

(1) තාපය සහ ඔක්සිජන්

(2) තාපය සහ කාබන්ඩයොක්සයිඩ්

(3) ආලෝකය සහ ඔක්සිජන්

(4) ආලෝකය සහ කාබන්ඩයොක්සයිඩ්


12. ගැල්වනයිස් කිරීමේදී යකඩ මත ආලේප කරන ලෝහය කුමක්ද?

(1) සින්ක් (2) මැග්නීසියම් (3) කොපර් (4) රසදිය

13. මේවායින් බයිස්‍රාවී එල <u>පමණක්</u> ඇති පිළිතුර තෝරන්න.

(1) දහදිය, මළ, මුත්‍රා (2) කාබන්ඩයොක්සයිඩ්, මුත්‍රා, මළ

(3) කඳුළු, ජලය, කාබන්ඩයොක්සයිඩ් (4) කාබන්ඩයොක්සයිඩ්, මුත්‍රා, දහදිය

14. 

රූපයේ දැක්වෙන්නේ විද්‍යුත් චුම්භකයකි. එහි ප්‍රබලතාව වැඩිකිරීමට ගත හැකි සුදුසු ක්‍රියාමාර්ගයක් වන්නේ,

(1) කෝෂ සංඛ්‍යාව වැඩිකිරීම හා කම්බියේ දිග වැඩි කිරීම.

(2) කෝෂ සංඛ්‍යාව වැඩි කිරීම හා කම්බියේ දිග අඩු කිරීම.

(3) කෝෂ සංඛ්‍යාව අඩු කිරීම හා කම්බියේ දිග අඩු කිරීම.

(4) කෝෂ සංඛ්‍යාව අඩු කිරීම හා කම්බියේ දිග වැඩි කිරීම.

15.  මෙම සංකේතයෙන් දැක්වෙන්නේ,

(1) ආලෝක සංවේදී ප්‍රතිරෝධකයකි. (2) ආලෝක විමෝචක ඩයෝඩයකි.

(3) ඍජුකාරක ඩයෝඩයකි. (4) විචල්‍ය ප්‍රතිරෝධයකි.

16. පාසලේ තනන ලද විද්‍යුත් පරිපථයක අවශ්‍ය විට විදුලි ධාරාව පාලනය කිරීමට යොදා ගත හැකි උපකරණය වන්නේ,

(1) වෝල්ට් මීටරය (2) ඇමීටරය (3) ධාරා නියාමයකය (4) ගැල්වනෝ මීටරය

17. සරල කෝෂයේ ඉලෙක්ට්‍රෝඩ වලින් වායු පිටවීම විද්‍යුතයේ කුමන ඵලයක් ප්‍රදර්ශනය කරයිද?

(1) රසායනික ඵලයයි. (2) තාපන ඵලයයි. (3) චුම්භක ඵලයයි. (4) ප්‍රකාශ ඵලයයි.

18. ජලභීතිකා රෝගය සෑදීමට හේතුවන ක්ෂුද්‍රජීවී කාණ්ඩය තෝරන්න.

(1) වෛරස් (2) බැක්ටීරියා (3) දිලීර (4) ප්‍රොටසෝවා

19. තන්තුමය මූල පද්ධතියක් සහිත ශාකයක දැකිය <u>නොහැකි</u> ලක්ෂණයක් වන්නේ,


(1) සිහින් දිගටි පත්‍ර තිබීම. (2) බීජයේ පියලි එකක් තිබීම.

(3) කඳ අතු බෙදී තිබීම. (4) සමාන්තර නාරටි වින්‍යාසයක් තිබීම.

20. පදාර්ථයේ ත්‍රිවිධ අවස්ථාවල අංශුවල සැකසුම පහත දැක්වේ. එම අවස්ථා පිළිවෙලින් හඳුනාගන්න.

(1) ඝන, ද්‍රව, වායු (2) ඝන, වායු, ද්‍රව

(3) වායු, ද්‍රව, ඝන (4) වායු, ඝන, ද්‍රව




Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



- **පළමු ප්‍රශ්නයට අනිවාර්යයෙන් පිළිතුරු සපයන්න. ඉතිරි ප්‍රශ්න 05 න් ඔබ කැමති ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න. (පිළිතුරු ලිවීමට වෙනම කඩදාසි භාවිත කරන්න.)**
- **සෑම ප්‍රශ්නයකටම ලකුණු 09 බැගින් හිමිවේ.**

01.




08 ශ්‍රේණියේ සිසුන් කණ්ඩායමක් විසින් සකස් කළ පරිපථයක් රූපයේ දැක්වේ. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) මෙහි භාවිත කර ඇති වියළි කෝෂයක වෝල්ටීයතාව කොපමණද? (ල. 01)

(ii) මෙහි A උපකරණය නම් කරන්න. (ල. 01)

(iii) A උපකරණයේ යම් වෙනසක් සිදුකළ විට ලැබෙන නිරීක්ෂණ 2 ක් ලියන්න. (ල. 02)


(iv) එම නිරීක්ෂණ ඇසුරෙන් ඔබට හඳුනාගත හැකි විද්‍යුතයේ ඵල දෙකක් නම් කරන්න. (ල. 02)

(v) ඉහත කෝෂ දෙක සම්බන්ධ කර ඇති ආකාරය නම් කරන්න. (ල. 01)

(vi) නිවස තුළ විද්‍යුත් උපකරණ භාවිතයට ගැනීමේදී අනුගමනය කළ යුතු ආරක්ෂිත පිළිවෙත් දෙකක් ලියන්න. (ල. 02)

02. (i) මානව ස්නායු පද්ධතිය පහත සඳහන් අයුරින් කොටස්වලට බෙදා දැක්විය හැකිය. මෙහි A, B, C නම් කරන්න. (ල. 03)

- මානව ස්නායු පද්ධතිය
  - මධ්‍ය ස්නායු පද්ධතිය
    - මොළය
      - C
      - අනුමස්තිස්කය
      - සුෂුම්නා ශීර්ෂකය
    - A
  - පර්යන්ත ස්නායු පද්ධතිය
    - B
    - සුෂුම්නා ස්නායු




(ii) මධ්‍ය ස්නායු පද්ධතියේ රූ සටහනක් ඉහත දැක්වේ. එහි P හා Q කොටස් දෙක නම් කරන්න. (ල. 02)


(iii) මොළයේ ආරක්ෂාව සඳහා පිහිටා ඇති අස්ථිමය ව්‍යුහය කුමක්ද? (ල. 01)

(iv) ගිනි අඟුරක් පෑගුන විට වහාම කකුල ඉවතට ගනී. මෙහිදී සම්බන්ධ වන මධ්‍ය ස්නායු පද්ධතියට අයත් කොටස කුමක්ද? (ල. 01)

(v) මෙම ක්‍රියාවට සම්බන්ධ වන කාරකය ලියන්න. (ල. 01)

(vi) ස්නායු පද්ධතියේ ආරක්ෂාවට අප විසින් අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගයක් ලියන්න. (ල. 01)

03. යකඩ මළ බැඳීම සඳහා අවශ්‍ය සාධක සෙවීම සඳහා පහත පරීක්ෂණය සිසු කණ්ඩායමක් විසින් සිදුකරන ලදී.




රූපයේ දක්වෙන පරිදි උපකරණ සකස් කර දින කීපයක් තබන ලදී.

(i) මෙහි A, B, C නළවල දක්නට ලැබෙන නිරීක්ෂණ ලියන්න. (ල. 03)

(ii) A හා B නළවලට පොල්තෙල් දැමීමේ අරමුණ කුමක්ද? (ල. 01)


(iii) මෙහිදී ලැබෙන නිරීක්ෂණවලින් සොයාගත හැක්කේ මළ බැඳීම සඳහා කුමන සාධකය අවශ්‍ය වන බවද? (ල. 01)

(iv) එම සාධකය හැර මළ බැඳීම සඳහා අවශ්‍ය අනෙක් සාධකය කුමක්ද? (ල. 01)

(v) මළ බැඳීම වේගවත් කරන සාධකයක් ලියන්න. (ල. 01)

(vi) යකඩ මළ බැඳීමෙන් වළක්වා ගැනීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග 2 ක් ලියන්න. (ල. 02)

04. ඉටිපන්දම් දැල්ලේ කලාප දැක්වෙන රූපසටහනක් මෙහි දැක්වේ.




(i) මෙහි A, B හා C කොටස් නම් කරන්න. (ල. 03)


(ii) ඉටි පූර්ණ දහනයේ දී ලැබෙන ඵල නම් කරන්න. (ල. 02)

(iii) එකී ඵල හඳුනාගැනීම සඳහා යොදාගත හැකි රසායන ද්‍රව්‍ය අදාළ ඵලය ඉදිරියෙන් ලියන්න. (ල. 02)

(iv) පූර්ණ දහනය හා අසම්පූර්ණ දහනය අතර වෙනස්කම් 2 ක් ලියන්න. (ල. 02)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

05. මිනිස් සිරුරේ විශාලතම ඉන්ද්‍රියය වනුයේ සමයි සමේ ව්‍යුහය දැක්වෙන රූපසටහනක් පහත රූපයේ දැක්වේ.




(i) මෙහි A, B, C හා D කොටස් නම් කරන්න. (ල. 02)

(ii) මෙලනින් නැමති වර්ණකය ඇත්තේ මින් කුමන කොටසේද? (ල. 01)

(iii) මෙම වර්ණකයෙන් සමට ඇති ප්‍රයෝජනයක් ලියන්න. (ල. 01)

(iv) සම බහිස්‍රාවී ඉන්ද්‍රියයක් ලෙස ක්‍රියාකරයි. එයින් පිටකරන බහිස්‍රාවී ද්‍රව්‍ය (ඵලය) කුමක්ද? (ල. 01)

(v) එම බහිස්‍රාවී ඵලයේ අඩංගු ද්‍රව්‍යයක් සඳහන් කරන්න. (ල. 01)

(vi) සමෙහි කෘත්‍යයන් දෙකක් ලියන්න. (ල. 02)

(vii) නිරෝගී සමක් පවත්වා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගයක් ලියන්න. (ල. 01)

06. ඔබට පහත සඳහන් ද්‍රව්‍ය හා ප්‍රබල දණ්ඩ චුම්බකයක් දී ඇත.

| |
|---|
| අල්පෙනිති, වීදුරු මූඩිය, යකඩ ඇණය, මකන කැල්ල, කාසිය, කඩදාසිය, ප්ලාස්ටික් කොපුව, ඇමුණුම් කටුව |

(i) මේවායින් චුම්බකවලට ආකර්ශනය වන ද්‍රව්‍ය හා චුම්බකවලට ආකර්ශනය නොවන ද්‍රව්‍ය වගුවකින් ඉදිරිපත් කරන්න. (ල. 02)

(ii) ස්ථිර චුම්බක භාවිත කරන අවස්ථා 2 ක් ලියන්න. (ල. 02)

(iii) චුම්බකයක චුම්බක බලය වැඩි ප්‍රදේශ හඳුන්වන නම කුමක්ද? (ල. 01)

(iv) ඔබට සර්වසම දණ්ඩ චුම්බක දෙකක් දී ඇත්නම් ඒවා විධිමත් ලෙස ගබඩාකර තබන ආකාරය ඇඳ දක්වන්න. (මේ සඳහා වෙනත් ද්‍රව්‍ය අවශ්‍ය නම් ඒවා ද ඇතුළත් කරන්න.) (ල. 02)

(v) චුම්බක ක්ෂේත්‍රයේ දිශාව සොයාගැනීමට භාවිත කළ හැකි උපකරණය කුමක්ද? (ල. 01)

(vi) ඔබට විද්‍යාගාරයේ දී ස්ථිර චුම්භකයක් තැනීමට සිදුවුවහොත්, එය සිදුකරන ආකාරය කෙටියෙන් ලියන්න. (ල. 01)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**08 ශ්‍රේණිය** **දෙවන වාර පරීක්ෂණය 2018** **විද්‍යාව**

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( 4 ) 02. ( 3 ) 03. ( 1 ) 04. ( 2 ) 05. ( 3 ) 06. ( 3 ) 07. ( 3 ) 08. ( 4 ) 09. ( 2 ) 10. ( 4 )
11. ( 1 ) 12. ( 1 ) 13. ( 4 ) 14. ( 2 ) 15. ( 2 ) 16. ( 3 ) 17. ( 1 ) 18. ( 1 ) 19. ( 3 ) 20. ( 4 )

## II කොටස

01. (i) 1.5 V (ල.01) (ii) ස්විචය (ල.01)
(iii) බල්බය දැල්වීම. (ල.01) කම්බි රත් වීම. (ල.01)
(iv) බල්බය දැල්වීම - ආලෝක ඵලය (ල.01) කම්බි රත්වීම - තාපන ඵලය (ල.01)
(v) ශ්‍රේණිගතව (ල.01)
(vi) තෙත අතින් නොඇල්ලීම.
රබර් පාපිස්සක් මත සිට ක්‍රියාකිරීම වැනි පිළිතුරු දෙකකට - (ල.02) (මුළු ලකුණු 09)

02. (i) A - සුෂුම්නාව B - කපාල ස්නායු C - මස්තිෂ්කය (ල.03)
(ii) P - මස්තිෂ්කය Q - අනුමස්තිස්කය (ල.02) (iii) කපාලය (ල.01)
(iv) සුෂුම්නාව (ල.01) (v) පාදයේ පේශි (ල.02)
(vi) නිවැරදි පිළිතුරකට (ල.02) (මුළු ලකුණු 09)

03. (i) A හි යකඩ ඇණ මළ බැඳී නැත. (ල.01) B හි යකඩ ඇණ මළ බැඳී ඇත. (ල.01)
C හි යකඩ ඇණ මළ බැඳී ඇත. (ල.01)
(ii) වායු ගෝලයේ ඇති ඔක්සිජන් වායුව (වාතය) දියවීම වැළැක්වීමට (ල.01)
(iii) වාතය / ඔක්සිජන් (ල.01) (iv) ජලය (ල.01)
(v) අම්ල / ලවණ (ල.02)
(vi) ග්‍රීස් ගෑම, තීන්ත ගෑම වැනි නිවැරදි පිළිතුරු 2 කට (ල.02) (මුළු ලකුණු 09)


04. (i) A - අදීප්ත කලාපය (ල.01) B - දීප්ත කලාපය (ල.01) C - යන්තමින් පෙනෙන බාහිර කලාපය (ල.01)
(ii) $CO_2$ - (ල.01) $H_2O$ - (ල.01)
(iii) $CO_2$ - හුණු දියර (ල.01) $H_2O$ - නිර්ජලීය $CuSO_4$ හෝ $COCl_2$ (ල.01)
(iv)

| පූර්ණ දහනය | අසම්පූර්ණ දහනය | |
|---|---|---|
| වැඩි ශක්තියක් පිටවේ. | අඩු ශක්තියක් පිටවේ. | (ල.01) |
| දැලි නොබැඳේ | දැලි බැඳේ | (ල.01) |

(මුළු ලකුණු 09)

05. (i) A - චර්මය B - අපිචර්මය C - ස්නේහස්‍රාවී ග්‍රන්ථිය D - රෝම දණ්ඩ (ල.02)
(ii) අපිචර්මයේ (ල.01) (iii) අහිතකර පාරජම්බුල කිරණවලින් සම ආරක්ෂා වීම. (ල.01)
(iv) ස්වේදය (දහදිය) (ල.01) (v) යූරියා, යූරික් අම්ලය, ඇමෝනියම් ලවණ, ජලය. (ල.01)
(vi) • ආරක්ෂක ආවරණයක් ලෙස ක්‍රියා කිරීම. • දේහ උෂ්ණත්වය පාලනය කිරීම.
• සංවේදී අවයවයක් ලෙස ක්‍රියා කිරීම. • විටමින් D නිෂ්පාදනය කිරීම.
• බහිස්‍රාවී කාර්යය සිදු කිරීම වැනි කෘත්‍යයන් 02 කට (ල.02)
(vii) • පෝෂ්‍යදායි ආහාර ලබා ගැනීම. • දිනපතා ස්නානය කිරීම.
• හිරු රශ්මියෙන් සම ආරක්ෂා කිරීම වැනි ක්‍රියාමාර්ග එකකට ලකුණු ලබා දෙන්න. (ල.01) (මුළු ලකුණු 09)

06. (i) චුම්බකවලට ආකර්ශනය වන ද්‍රව්‍ය - අල්පෙනෙති / යකඩ ඇණය / කාසිය / ඇමුණුම් කටුව
චුම්බකවලට ආකර්ශනය නොවන ද්‍රව්‍ය - වීදුරු මූඩිය / මකනය / කඩදාසිය / ප්ලාස්ටික් කොප්පුව (ල.02)
(ii) මාලිමාව, පැන්සල් පෙට්ටිය වැනි පිළිතුරු දෙකකට (ල.02)
(iii) චුම්බක ධ්‍රැව (ල.01) (iv)




(ල.01)
(v) මාලිමාව (ල.01)
(vi) ස්පර්ශ ක්‍රමය හෝ විද්‍යුත් ක්‍රමය (ල.01) (මුළු ලකුණු 09)